**කන්දකැටිය ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 06 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දිනද, සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ආදායම් ගිණුම්ගත කිරීම මුදල් පදනම මත සිදුකර තිබීම හේතුවෙන් මුද්දර ගාස්තු,පොල බදු, ජල ගාස්තු හා කඩකුලී ආදායම් රු.1,645,548 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ රු.2,100,745 ක් වුවද, එය මුදල් පදනම අනුව රු.3,252,886 ක් ලෙස දැක්වීම නිසා රු.1,152,141 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (iii) | ස්ථාවර තැන්පතු දෙකක් සඳහා සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු පොලී ආදායම රු.444,563 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (iv) | ඉකුත් වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලිය රු.290,395 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමානදෑ රු.2,931,319 ක් වුවද, එය රු.4,582,072 ක් ලෙස රු.1,650,753 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | 2019 දෙසැම්බර් 31 දිනට සතිපොළ ගොඩනැඟිල්ල ඉදිකිරීමේ නිම් වැඩ රු.3,402,608 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය රු.4,909,848 ක් වුවද, රු.6,389,499 ක් ලෙසට රු.1,479,651 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු තැන්පතු රු.2,427,809 ක් වගකීම් යටතේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට පියවර ගනිමි. |

(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස්දැක්වීම |
|---|---|---|
| රු.53,416,999 ක ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය සඳහා ඔප්පු, උපලේඛන හා තක්සේරු වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සභාව සතු ඉඩම් පවරාගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. |

## 1.4 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම්</u>

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2019 මැයි 06 දින අනතුරට පත් ට්‍රැක්ටර් රථයක අවසාන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | අදාල කටයුතු මේවනවිට සිදුවෙමින් පවති. |
| (ii) මුදල් රෙගුලාසි 571(2) | තැන්පත් කර වසර 02 ඉක්මවා තිබුණු රු.268,047 ක කර්මාන්ත අත රැඳවුම් 07 ක් නිදහස් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | නිරවුල් කිරිමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති<br>රීති 180 | ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | ඇප තැන්පත් මුදල් ලබාගැනීමට කටයුතු කරමි. |

## 2. මුල්‍ය සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,415,761 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,247,092 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 1,803,740 | 5,140,940 | 1,601,077 | 380,186 | 3,276,501 | 3,375,500 | 4,135,141 | 692,717 |
| ii. | කුලී | 3,475,561 | 169,200 | 1,706,475 | 43,150 | 769,200 | 769,200 | 136,400 | 43,150 |
| iii | බලපත්‍ර ගාස්තු | 661,000 | 497,150 | 497,150 | - | 848,000 | 556,450 | 556,450 | - |
| iv | වෙනත් ආදායම් | 456,000 | 465,679 | 465,679 | - | 130,000 | 130,000 | 540,787 | 2,715,700 |
| | එකතුව | 6,396,301 | 6,272,969 | 4,270,381 | 423,336 | 5,023,701 | 4,831,150 | 5,368,778 | 3,451,567 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස්දැක්වීම |
|---|---|---|
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු හිඟ හිටි ආදායම් රු.3,031,815 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | ලැබිය යුතු ණය ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කිරීමටත්, අයකර ගත නොහැකි ජල බිල්පත් ගාස්තු කපා හැරීමටත් අවශ්‍ය පියවර ගනිමි. |

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස්දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.4,269,512 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු.1,206,665 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ හා හිඟ මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | කඩිනමින් එම මුදල් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා පිළියෙල කර ඇත. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ " තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කර ගත හැකි වන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඩ කාමර තුනක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල හිඟ කඩ කුලී රු.72,600 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ කඩ කුලී අය කර ගත යුතුවේ. | ගෙවීම් පැහැර ඇති පාර්ශව දැනුවත් කර ඇත. නීත්‍යානුකූලව කටයුතු කරමි. |
| (ආ) | සභාවේ ගබඩාවක් ලෙස භාවිතා කරන ගොඩනැඟිල්ල පිහිටි ඉඩමේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරයා වෙත ඉල්ලීම් කර ඇත. |
| (ඇ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන ණය හිමියෝ රු.9,215,967 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |

### 3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 07 කට අදාලව පුරප්පාඩු 13 ක් පැවතුනි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර, මේ වන තෙක් පිරවීමට කටයුතු කර නොමැත. |

### 3.4 <u>මෙහෙයුම් අකාර්යක්මතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට අයත් ඩබල් කැබ් රථයක් ප්‍රයෝජනයට නොගෙන වර්ෂ 10ක් නිෂ්කාර්යව පැවතුනි. | නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියමාර්ග ගත යුතුවේ. | විධිමත් ක්‍රමවේද අනුගමනය කරමින් අලුත්වැඩියා කිරිමට කටයුතු කරමි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(අ)ඡේදය අනුව කන්දකැටිය සතිපොල භූමියේ පිහිටි ගොඩනැඟිල්ල ඉදිකිරීමේ ගිවිසුම් මුදල රු.3,208,707 ක් සඳහා සියයට 5 ක කාර්යසාධන සුරක්ෂණය රු.179,794 ක් අඩුවෙන් අය කරගෙන තිබුණි. තවද කර්මාන්තයේ වැඩ විෂයයන් දෙකක් සඳහා රු.83,490 ක මුදලක් නිමි වැඩ වටිනාකමට වඩා වැඩියෙන් ගෙවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු අතර, වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරගත යුතුවේ. | එකල සිටි නිලධාරින්ගෙන් අතපසුවීමක් සිදුව ඇති බව දන්වන අතර, වැඩිපුර ගෙවූ මුදල අතරුදවුම් මුදල් ගෙවිමේදි අයකර ගනිමි. |

### 3.5 <u>වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කළ යුතුවේ. | ඉදිරියේදි පිළියෙල කිරිමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1. විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | කාර්තුවකට වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොමැත. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | මෙම වර්ෂයේදි අභ්‍යන්තර විගණන කටයුතු නිසි පරිදි සිදුකිරිමට කටයුතු කරමි. |